
# වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ නීති රාමුව





# අපරාධවල වින්දිතයින් සහ සාක්ෂි-කරුවන් වන ඔබට නීතියෙන් ලැබෙන යම් ආරක්ෂාවක් තිබේද?

ඔව්. 2015 අංක 04 දරන අපරාධවල වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ට සහය ලබාදීමේ හා ආරක්ෂාව ලබාදීමේ පනත 2015 වර්ෂයේදී සම්මත කරගනු ලැබුවේ යුක්තිය පසිඳලීම වඩාත් ශක්තිමත් කෙරෙන බව සහතික කිරීම සඳහා අපරාධවල වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව ලබාදීම පිණිස වේ.





# වින්දිතයා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) සහ (2) වගන්තිවල මෙසේ දැක්වේ:

(1) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ යී යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේ ය.

(2) අත් අඩංගුවෙහි තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තකු ම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත් අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේ ය.



<u>වින්දිතයා යනු කවුද?</u>

- යම් නීතියක් යටතේ වරදක් වන; හෝ
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) හෝ (2) වගන්ති යටතේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් වන

ඕනෑම ක්‍රියාවක් හෝ නොකර සිටීමක් හේතුවෙන්


- තුවාලවීමට
- හානිවීමට
- සිරුරේ අවයවයක් කැඩීබිඳීයාමට හෝ ආබාධිතවීමට (ශාරීරික හෝ මානසික)
- චිත්තවේගීය පීඩාවට
- ආර්ථික හෝ වෙනත් අහිමිවීමකට

ලක්වන ඕනෑම අයෙකු (ළමයින් ද ඇතුළුව) වින්දිතයකු වේ

පහත පුද්ගලයින්ද වින්දිතයින් වශයෙන් සලකනු ලැබේ:

- තවත් වින්දිතයකුට උපකාර කිරීම සඳහා
- යම් වරදක් සිදුකිරීම වැලැක්වීම සඳහා

මැදිහත්වීමක් කිරීමට යාමෙන් හානියට/තුවාලයට ලක්වන පුද්ගලයකු




<u>වින්දිතයින්ට ඇති අයිතිවාසිකම් මොනවාද?</u>


සමානාත්මතාවය, සාධාරණත්වය සහ ගරුත්වය ඇතිව සැලකුම් ලැබීමට

නොපමාව ප්‍රතිකර්මයක් ලැබීමට

තමන්ට ලබාගත හැකි නෛතික ප්‍රතිකර්ම පිළිබඳව, විමර්ශන කටයුතුවල ප්‍රගතිය සම්බන්ධයෙන් සහ ලබාගත හැකි වෛද්‍ය, සමාජසේවා සහ වෙනයම් උපකාර සම්බන්ධයෙන් දැනුම්දෙනු ලැබීමට

පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට සහ කවර හෝ පොලිස් නිලධාරියකු විසින් එය සටහන් කරගනු ලැබීමට සහ නීතීඥවරයකු ගේ නියෝජනය ලබා-ගැනීමට යනාදිය සඳහා

තීන්දුව පිළිබඳව තීරණයකට එළඹීමට පෙර අභියාචනා අවස්ථාවේදී හෝ වරදකරු බවට පත්වූ පුද්ගලයාට සමාවදීමට සලකා බලන අවස්ථාවකදී එම වරද හේතුවෙන් තමන්ගේ ජීවිතයට ඇතිවූ බලපෑම කෙබඳු වේද යන්න පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට වින්දිතයාට හැකිය




# සාක්ෂිකරු


නීතිය ක්‍රියාත්මක කරන ආයතනයකට තොරතුරු ලබාදීම, එවන ආයතනයක පැමිණිල්ලක් කිරීම හෝ ප්‍රකාශයක් ලබාදීම; සාක්ෂි ලබාදීම හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් වන තාත්වික හෝ වියහැකි හානි□ තර්ජන, බියවැද්දීම්, පලිගැනීම් හෝ එකට එක කිරීම්වලින් සාක්ෂිකරුවා ආරක්ෂා කළ යුතු වේ.

## සාක්ෂිකරුවකු යනු කවුද?

සාක්ෂිකරුවකු යනු:

- සිදුකළ බවට චෝදනා කරන වරදක්ෘ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් හෝ මානව හිමිකම් කඩකිරීමක් සම්බන්ධයෙන් යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් ආරම්භ කිරීමට පදනම් කරගත් හෝ එසේ ආරම්භවීමට ආසන්න තත්වයක් ඇතිවීමට හෝ හේතුවන අන්දමින් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියකු ඉදිරියේ යම් තොරතුරක් ලබාදුන් හෝ යම් පැමිණිල්ලක් ඉදිරිපත් කළ අයෙක්
- නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් එවන් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සිදුකෙරෙමින් පවතින අතරතුර ඒ සඳහා තොරතුරු ලබාදුන් හෝ ප්‍රකාශයක් කළ අයෙක්
- යම් වින්දිතයකු කළ පැමිණිල්ලක් හෝ ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ගයක් සඳහා ආධාරක වන අන්දමේ දිවුරුම් ප්‍රකාශයක් හෝ ප්‍රකාශයක් ලබාදුන් අයෙක්
- කොමිෂන් සභාවකට තොරතුරු හෝ වෙනත් ප්‍රකාශනයක් ලබාදුන් අයෙක්
- කවර හෝ අධිකරණමය හෝ අර්ධ අධිකරණමය කාර්යපටිපාටියකදී ප්‍රකාශයක් කිරීමට, සාක්ෂිදීමට, යම් ලේඛනයක්, වාර්තාවක් වෙනත් යමක් ඉදිරිපත් කිරීමට අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් කැඳවුම් ලැබෙනු ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති හෝ එසේ කැඳවුම් ලබා ඇති අයෙක්
- රජයේ නිලධාරියකු වශයෙන්, සිදු වූ බවට චෝදනා කෙරෙන යම් වරදක්, යම් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් හෝ මානව හිමිකම් කඩකිරීමක් සම්බන්ධ-යෙන් විමර්ශනය කළ අයෙක්

පහත අයද සාක්ෂිකරුවන් අතරට ඇතුළත් වේ:




## සාක්ෂිකරුවන්ට ඇති අයිතිවාසිකම් මොනවාද?

විමර්ශකයින්ගෙන්, අධිකරණ නිලධාරීන්ගෙන් සහ අර්ධ අධිකරණ නිලධාරීන්ගෙන් සාධාරණ හා ගරුත්වයෙන් යුතු සැලකුම් ලැබීමට සහ හිංසනයට හෝ බියවැද්දීමට හෝ බලාත්කාරයට හෝ අයිතිවාසිකම් කඩකිරීමට ලක් නොවී සිටීමට සාක්ෂිකරුවාට අයිතියක් ඇත.



# ආරක්ෂාව

අපරාධ වල වින්දිත්යන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීම සඳහා අපරාධ වින්දිත්ය-න් සහ සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීමේ ජාතික අධිකාරිය (අධිකාරිය ලෙස හඳුනාග නු ලබන) පිහිටුවා ඇත.

- අධිකාරියේ කළමනාකාරී මණ්ඩලයට ජනාධිපතිතුමා විසින් පත් කරන සාමාජික-යන් 5 දෙනෙකු ඇතුලත් වන අතර ඔවුන්
  - අපරාධවේදය/ අපරාධ පරීක්ෂණ විද්‍යාව
  - අපරාධ යුක්තිය පද්ධතිය
  - මනාවහිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාකිරීම
  - වෛද්‍ය විද්‍යාව යන අංශ සම්බන්ධයෙන්

අධයාපනිකව සහ වෘත්තිමයව සුදුසුකම් ලත් පුද්ගලයන් වියයුතු අතර වෘත්තිමය අත්දැකීම් ඇති පුද්ගලයන් වියයුතුයි.

- තවද, නිලබලයෙන් පත්කරනු ලබන සාමාජිකයන් 7 දෙනෙකු ඇතුලත් වන අතර ඔවුන්
  - නිතිය, පොලිස් දෙපාර්තමේන්තුව “කාන්තා කටයුතු” ළමා යන අමාත්‍යංශවල ලේකම්වරු සහ
  - ශ්‍රී ලංකා මානවහිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයකු
  - නීතිපති විසින් නම් කළ තැනැත්තකු සහ
  - පොලිස්පති විසින් නම් කළ තැනැත්තකු වේ

කොට්ඨාශය/අංශය කුමක්ද?

- අපරාධ වල වින්දිත්යන්ට සහ සාක්ෂිකරුවන්ට සහයදෙන්නන් සහ ආරක්ෂාව ලබාදෙන අංශය (කොට්ඨාශය/අංශය ලෙස හඳුනාගනු ලබන) අධිකාරියේ උප-දේශනයේ /නිර්දේශයේ සහ මගපෙන්වීමට යටත්වේ
- පොලිසියේ ජ්‍යෙෂ්ඨ පොලිස් සාමාන්‍යධිකාරීවරයකු මෙම අංශයේ බාරව කටයුතු කරයි

ආරක්ෂාව පතා වින්දිතයා/සාක්ෂිකරු ඉල්ලීමක් කළයුත්තේ කා වෙතද?

- අපරාධවල වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය
- අපරාධවල වින්දිතයින්ට හා සාක්ෂිකරුවන්ට සහය සහ ආරක්ෂාව ලබාදීමේ අංශය
- අධිකරණ
- ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිතුමා
- කොමිෂන් සභා:
    - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
    - අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
    - විමර්ශන කොමිෂන් සභා හෝ විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා
    - විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද වෙනත් ඕනෑම කොමිෂන් සභාවක්

‘අපරාධවල වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ට සහය හා ආරක්ෂාව ලබාදීමේ වැඩ-සටහනට’ යම් වින්දිතයකු ඇතුළත් වන්නේ කෙසේද?

අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු සිදුකරන ඉල්ලීමක් මත

අධිකාරියෙන් ලබාදෙන නිර්දේශයක් මත

නීතිය ක්‍රියාත්මක කරන ආයතන හෝ රාජ්‍ය නිලධාරියකු විසින් ඉදිරිපත් කරන වාර්තාවක් මත

අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් කරන දැනුම්දීමක් මත

වින්දිතයින් එම වැඩසටහනට ඇතුළත් කළ හැකිය.

- වින්දිතයා/සාක්ෂිකරු මුහුණදෙන තර්ජනය ඇගැයුම් කිරීමෙන් පසුව වින්දිතයා/සාක්ෂිකරුගේ කැමැත්ත ඇතිව ආරක්ෂාව සහ සහය ලබාදෙනු ලැබේ
- සහය සහ ආරක්ෂාව ලබාදීමේ වැඩසටහන සක්‍රිය කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට වින්දිතයාට සිදුවිය හැකි ය



ඔබ දැනසිටියාද?

- සිදු කරනු ලැබූ වරද හේතුවෙන් සහ අධිකරණ කාර්යපටිපාටියට සහභාගිවීම හේතුවෙන් වින්දිතයාට දරන්නට වූ වියදම් පියවා ගැනීම සඳහා අධිකාරියෙන් මුදල් ඉල්ලුම් කිරීමට වින්දිතයාට හැකි ය
- අවශ්‍ය කරන සම්පත් රජය සතුව ඇති අවස්ථාවල තමන්ට වූ ශාරීරික හෝ මානසික හානි සඳහා අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර රජයෙන් ඉල්ලා සිටීමටත් ලබාගැනීමටත් වින්දිතයාට හැකි ය

විත්දිතයකුට/සාක්ෂිකරුවකුට කල්තබාම ආරක්ෂාව ලබාගත හැකිද?

- යම් වරදක් හෝ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සම්බන්ධයෙන් කෙරෙන යම් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට සහභාගිවීම හේතුවෙන් හෝ
- එවන් යම් අධිකරණ ක්‍රියාවලියකට සහභාගිවීමට අදහස් කරගෙන සිටින හෙයින්

තමන්ට යම් හානියකට මුහුණ දෙන්නට සිදුවනු ඇතැයි විශ්වාසකිරීමට සාධාරණ හේතු ඇති වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට එවන් තාත්වික හෝ වියහැකි හානියකින් ආරක්ෂාවීම සඳහා ඉල්ලුම් කිරීමට හැකිය.

ඔබට ඉල්ලා සිටිය හැක්කේ කුමන ආකාරයේ ආරක්ෂාවක් ද?

පවතින සම්පත් ආරක්ෂාව සඳහා වන අවශ්‍යතාවය සහ අදාළවන නීති පදනම් කර-ගනිමින් ලබාදෙන ආරක්ෂක විධිවිධාන අතරට පහත ඒවා ඇතුළත් විය හැක:

- පුද්ගලයාට හා දේපළට සපයන ආරක්ෂාව
- තාවකාලික නවාතැන්
- වින්දිතයාගේ/සාක්ෂිකරුගේ කැමැත්ත ඇතිව ස්ථිර වශයෙන් වෙනත් ස්ථානයක පදිංචි කිරීම
- තාවකාලික හෝ ස්ථිර රැකියාවක් ලබාදීම
- අළුත් අනන්‍යතාවයක් ලබාදීම
- වෙනත් ක්‍රියාමාර්ග


ආරක්ෂාව ලබාදීම නැවැත්විය හැක්කේ කාහටද?



අධිකාරිය



අංශය භාරව සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී



ඕනෑම කොමිෂන් සභාවක්

ආරක්ෂාව ලබාදීම නැවැත්විය හැක්කේ කුමන පදනමකින් ද?

- ආරක්ෂාව ලබාදීමේ අවශ්‍යතාවයක් තවදුරටත් නොමැති වූ කල
- වින්දිතයා/සාක්ෂිකරු
  - ආරක්ෂාව ලබාදීම නවතාලන මෙන් ඉල්ලා සිටිකල
  - ආරක්ෂාව ලැබීම ප්‍රතික්ෂේප කරන කල
  - ලැබෙන ආරක්ෂාවෙන් අයුතු ප්‍රයෝජන ගන්නා කල
  - සාමය කඩ කිරීමක් හෝ මහාධිකරණයේ නඩු විභාග කළයුතු අන්දමේ වරදක් කළ විට
  - අවබෝධතා ගිවිසුමට පටහැනි අන්දමින් ක්‍රියාකළ විට
  - වැරදි තොරතුරු සපයා ඇති බව හෙළිදරවු වූ කල

ආරක්ෂාව ලබන වින්දිතයකු හෝ සාක්ෂිකරුවකුගේ වගකීම් මොනවාද?

- ලැබෙන ආරක්ෂාව අයුතු ලෙස යොදගැනීමෙන් වැලකිය යුතු ය
- වැරදි තොරතුරු ලබා නොදිය යුතු ය
- අවබෝධතා ගිවිසුමට පටහැනි අන්දමින් ක්‍රියා කිරීමෙන් වැලකිය යුතු ය

# වන්දි ගෙවීම



ඔබට අධිකාරියෙන් වන්දි ඉල්ලා සිටිය හැක්කේ කුමන අවස්ථාවලද?

- ශාරීරික හෝ මානසික හානි වෙනුවෙන් සහ දේපළ හානි හා අහිමිවීම් වෙනුවෙන්
- වෛද්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපනය හෝ උපදේශන සේවා ලබාගැනීම වෙනුවෙන්

යම් වරදක් සඳහා වරදකරු වන පුද්ගලයකුට එම වරද වෙනුවෙන් නීතියෙන් නියම වන දඬුවමට අමතරව වින්දිතයාට වන්දි ගෙවන මෙන් අධිකරණයෙන් නියම කිරීමට ඉඩ තිබේ.

සම්බන්ධ කරගැනීම ප්‍රයෝජනවත් ආයතනඃ

අපරාධවල වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

අංක 428/11 ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල
දුරකථනඃ 011 287 9540

අධිකරණ අමාත්‍යාංශය

උපරිමාධිකරණ සංකීර්ණය, අධිකරණ මාවත, කොළඹ, 12 01000
දුරකථනයඃ 011 232 3022

ජාතික ක්‍රිස්ත්‍රියානි ධර්මදූත සංධානය (NCEASL)

ධර්මදූත කිතුණුවන්ගේ නියෝජන ආයතනය වන ජාතික ක්‍රිස්ත්‍රියානි ධර්මදූත සංධානය ශ්‍රී ලංකාවේ සුළුතර කණ්ඩායම්වල ආගමික නිදහස ආරක්ෂා කිරීමේ නියැලේ.

ලිපිනයඃ තැ.පෙ. 113, දෙහිවල, ශ්‍රී ලංකාව
දුරකථනඃ 011 551 1358
ඊමේල්ඃ legal@nceasl.org
වෙබ් අඩවියඃ www.nceasl.org

NCEASL

© The Religious Liberty Commission of the NCEASL. All rights reserved.